**අවසන් සැතපුම යාම : ශ්‍රී ලංකාවේ දැනට පවතින දුම්පානය 10 % ට පහළ අගයකට අඩු කිරීම.**

ශ්‍රී ලංකාවේ දැනට පවතින දුම්පානය 2005 දී 40.5 % සිට 2018[1] දී 28.4 % දක්වා අඩු කිරීම සතුටුදායකය. එහෙත් දුම්කොළ භාවිතය නිසා හට ගන්නා පිළිකා සහ අනෙකුත් බෝ නොවන රෝග හේතුවෙන් 2015[2] දී රටට දැරීමට සිදු වූ දුම්කොළ පරිභෝජන වියදම <u>රුපියල් මිලියන 89</u> කි. 2015 දී රටට දැරීමට සිදු වූ දුම්කොළ ආශ්‍රිත සෞඛ්‍ය පිරිවැය රාජ්‍ය ආදායමෙන් 6.1 % කි. එය එකී වසරේ සිගරට් සහ දුම්කොළ මඟින් උපයන ලද ආදායමට එනම්, රාජ්‍ය ආදායමෙන්[3] 5.5 % කට වඩා විශාලය. සෑම වසරකම දුම්කොළ ආශ්‍රිත රෝග[4] හේතුවෙන් මියයන ශ්‍රී ලාංකිකයින් ගණන 12300 කට වැඩිය.

ශ්‍රී ලංකාවට දැනට පවතින දුම්කොළ භාවිතය අඩු කිරීමට හැකි වුයේ ප්‍රධාන දුම්කොළ පාලන ප්‍රතිපත්තීන් කිහිපයක් ක්‍රියාවට නැංවීම හේතුවෙන්ය. එනම්, (අ) සිගරට් පැකට්ටුවෙන් 80 % ක ප්‍රමාණයක රූපමය අනතුරු හැඟවීම දැක්වීමට කටයුතු කිරීම සහ 2016 දී (ආ) සිගරට් වල මිළ ගණන් ඉහළ නැංවීම, (ඇ) ප්‍රසිද්ධ මාධ්‍යවල දුම්කොළ ආශ්‍රිත ප්‍රචාරණ දැන්වීම් තහනම් කිරීම සහ (ඈ) ගෘහස්ථ පොදු ස්ථානවල දුම්පානය තහනම් කිරීමය. දුම්කොළ නිෂ්පාදන කර්මාන්තයේ නියමුවන්ගේ බාධා කිරීම් මධ්‍යයේ වුවද ඉහත කී ප්‍රතිපත්තීන්ගෙන් සමහරක් ක්‍රියාත්මක කිරීමට පැහැදිලි දේශපාලන අධිෂ්ඨාන ශක්තියක් අවශ්‍ය විය. මෙකී ජයග්‍රහණ හමුවේ වුවද දැනට ද දුම්කොළ භාවිතය සෞඛ්‍ය ගැටලු ඇති කරන අතර, පවුල් ජීවිත වලට බාධා පමුණුවයි. එසේම රටේ ගෘහස්ථ ආදායම වඩාත් ඵලදායක භාවිතයන්ගෙන් ඈත් කරනු ලබයි.

**අභියෝගය : අවසන් සැතපුම**

ශ්‍රී ලංකාවේ දුම්පානය පිළිබඳ සමස්ත අනුපාතයන් පහත වැටෙමින් තිබුනද තවමත් එය ඉහළ අගයකි. (පිරිමින්ගෙන් 29.4 % ක්)[5] වයස අවුරුදු 40 සහ ඊට ඉහළ පිරිමින්[6] අතර දුම්කොළ භාවිතය විශේෂිතවම ඉහළය. (31.9 % කි.) එසේම වඩාත් අඩු ආදායම්ලාභීන්[7] අතර සහ නුවරඑළිය, වව්නියාව, මුලතිව්, මන්නාරම සහ කිලිනොච්චි[8] දිස්ත්‍රික්ක වල මෙය සංකේන්ද්‍රනය වී පවතී. තවද වයස අවුරුදු 15 – 24 අතර පිරිමි ළමුන් සලකා බැලීමේදී පාසල් නොයන පිරිමින්[9] අතර දුම්කොළ භාවිතය වඩාත් ඉහළය.

දුම්පානය පැවතීමේ අනුපාතය 10 % ට වඩා අඩු කිරීම මඟින් ශ්‍රී ලාංකිකයින්ට අති මහත් මහජන සෞඛ්‍යමය සහ ආර්ථික ප්‍රතිලාභයන් හිමිවනු ඇත. දැනට සිටිනු ලබන දුම්පානය කරන්නන් අතර, දුම්කොළ භාවිතය අඩු කිරීමට විශේෂිත සහ වඩාත් ඉලක්ක ගත ක්‍රියා මාර්ගයන් අවශ්‍ය වේ. දුම්කොළ ආශ්‍රිත ප්‍රචාරණ සීමා කිරීමේ සහ දුම්කොළ ආශ්‍රිත හානි පිළිබඳව මහජනයා දැනුවත් කිරීමේ දැනට ක්‍රියාත්මක ප්‍රතිපත්තීන් හමුවේ දුම්කොළ නිෂ්පාදන කර්මාන්තය දුම්කොළ නිෂ්පාදන ප්‍රචලිත කිරීමේ කටයුතු සඳහා වෙහෙසෙනු ලැබේ.

එවැනි ක්‍රියා මාර්ග මැඩලීම සඳහා සිගරට් මිළ දී ගැනීමේ හැකියාව අඩු කිරීම, දුම්කොළ ආශ්‍රිත හානි පිළිබඳව දැනුවත් කිරීම් වැඩි කිරීම, සෘජු සහ වක්‍ර ආකාරයෙන් දුම්කොළ භාවිතය ප්‍රචලිත කිරීම වළක්වනු ලබන පරිපාලන ක්‍රියා මාර්ගයන් ශක්තිමත් කිරීම සහ දුම්කොළ සඳහා ඇබ්බැහි වීමෙන් අත්මිදීමට ජනයාට උදව් උපකාර කිරීම තුළින් වඩාත් ශක්තිමත් දේශපාලනමය කැපවීමක් අවශ්‍ය වේ.

**ප්‍රතිපත්තිමය වෙනස්කම්**

ප්‍රධාන ජනාධිපතිධුර අපේක්ෂකයින් විසින් දුම්පානය ශ්‍රී ලංකාවට බලපානු ලබන බරපතල සෞඛ්‍යමය ගැටලුවක් බවට පිළිගෙන ඇති අතර, ලෝක සෞඛ්‍ය සංවිධානයේ දුම්කොළ භාවිතය පාලනය පිළිබඳ සම්මුති රාමුවට (Framework Convention on Tobacco Control) අනුව කටයුතු කිරීමට එකඟ වී ඇත. මේ සඳහා ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය (Institute of Policy Studies of Sri Lanka) පහත දැක්වෙන ප්‍රතිපත්තිමය වෙනස්කම් නිර්දේශ කර ඇත.

- ආදායම සහ මිළ වැඩි වීම් වලට සමානුපාතිකව අඛණ්ඩව දුම්කොළ සඳහා වන බදු ඉහළ නැංවීම මඟින් දුම්කොළ නිෂ්පාදන මිළදී ගැනීමේ හැකියාව අඩු කිරීම.
- දුම්කොළ සහ මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත (NATA Act) ශක්තිමත් කිරීම සහ දුම්කොළ නිෂ්පාදන වලට අදාළ රෙගුලාසිවල අඩු ලුහුඬුකම් වලට සුදුසු ප්‍රතිකර්ම යෙදීම.
- සිගරට් පැකට්ටු වශයෙන් නොව තනිව අලෙවි කිරීම තහනම් කිරීම මඟින් සෞඛ්‍යමය අනතුරු ඇඟවීම පිළිබඳ දැනුම සහතික කිරීම.
- තනි පුද්ගලයන්ට දුම්පානයෙන් අත් මිදීමට උපකාරීවීම අරමුණු කරගත් සැලසුම් සහගත වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- දුම්කොළ ආශ්‍රිත තොරතුරු පිළිබඳව දැනුවත් වීමේ හැකියාව වර්ධනය කිරීම සහ සාවද්‍ය තොරතුරු පැතිරීමට එරෙහිව ප්‍රතිකර්ම ගැනීම.
- වර්ෂ 2020 දී දුම්කොළ වගාව තහනම් කිරීම ක්‍රියාත්මක කිරීම.


1. මධ්‍යසාර සහ අන්තරාදායක ඖෂධ තොරතුරු මධ්‍යස්ථානය, ශ්‍රී ලංකාවේ දුම්පානය, විවිධ ගැටලු පිළිබඳ වාර්ෂික නැඹුරතා සමීක්ෂණය, ඇඩික්, කොළඹ.
2. ලෝක සෞඛ්‍ය සංවිධානය (2017), 2015 දී ශ්‍රී ලංකාවේ දුම්කොළ සහ මධ්‍යසාර පිළිබඳ ආර්ථික සහ සමාජමය වියදම්, ලෝක සෞඛ්‍ය සංවිධානය, ශ්‍රී ලංකාව
3. මුදල් අමාත්‍යාංශය
4. ද ටොබෑකෝ ඇට්ලස් කන්ට්‍රි ශ්‍රී ලංකා (2019) https://tobaccoatlas.org/country/sri-lanka/

5. ලෝක සෞඛ්‍ය සංවිධානය සහ සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය (2015) බෝ නොවන රෝග අවධානම් සාධක සමීක්ෂණය, ශ්‍රී ලංකාව - ශ්‍රී ලංකා ස්ටෙප්ස් සමීක්ෂණය 2015

6. මධ්‍යසාර සහ අන්තරදායක ඖෂධ තොරතුරු මධ්‍යස්ථානය (2019), 2018 ශ්‍රී ලංකාවේ දුම්පානය පිළිබඳ වාර්ෂික නැඹුරුතා සමීක්ෂණය.

7. සමීක්ෂණ සහ දත්ත දෙපාර්තමේන්තුව (2017) 2016 ජනවාර්ගික සහ සෞඛ්‍ය සමීක්ෂණය, සමීක්ෂණ සහ දත්ත දෙපාර්තමේන්තුව, කොළඹ.

8. සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය (2016), 2016 වාර්ෂික සෞඛ්‍ය සඟරාව, සෞඛ්‍ය පෝෂණ සහ දේශිය වෛද්‍ය අමාත්‍යාංශය, කොළඹ.

9. සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය (2016), 2016 වාර්ෂික සෞඛ්‍ය සඟරාව, සෞඛ්‍ය පෝෂණ සහ දේශිය වෛද්‍ය අමාත්‍යාංශය, කොළඹ.